සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2016 ජනවාරි

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය

(Business Operations and Management)

2016-02-07
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන් "මෙහෙවර" යන පදය වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන්නේ කුමකින් ද?

(1) "අනාගතයේ අපි යාමට ඉලක්ක කළ යුතු තැන හා අපි කළ යුත්තේ කුමක් ද" යන ප්‍රශ්නවලට මෙහෙවර මඟින් පිළිතුරු සපයයි.

(2) සංවිධානයේ අනාගතය පිළිබඳව මෙහෙවර මඟින් පැහැදිලි කරයි.

(3) ව්‍යාපාරයේ අරමුණු හා වටිනාකම් යන දෙකම පිළිබඳව මෙහෙවර මඟින් සන්නිවේදනය කරයි.

(4) සංවිධානයක පැවතීම සඳහා හේතුව මෙහෙවර මඟින් පැහැදිලි කරයි. (ලකුණු 02)

1.2 පහත දැක්වෙන ඒවායෙන් කළමනාකරණයේ මූලික සංකල්පයක් **නොවන්නේ** කුමක් ද?

(1) කාර්යක්ෂමතාව. (2) සඵලදායකත්වය

(3) ඵලදායකත්වය. (4) අවිනිශ්චිතතාව (ලකුණු 02)

**1.3** පහත දැක්වෙන ඒවායෙන් "ඵලදායකත්වය" යන වචනය නිවැරදිව පැහැදිලි කෙරෙන්නේ කුමකින් ද?

(1) ඵලදායකත්වය $= \dfrac{\text{ළඟා කරගත් අරමුණු}}{\text{සැලසුම් කරන ලද අරමුණු}}$

(2) ඵලදායකත්වය $= \dfrac{\text{මුළු යෙදවුම්}}{\text{මුළු නිමැවුම}}$

(3) ඵලදායකත්වය $= \dfrac{\text{භාවිත කරන ලද සම්පත්}}{\text{වෙන් කරන ලද සම්පත්}}$

(4) ඵලදායකත්වය $= \dfrac{\text{මුළු නිමැවුම}}{\text{මුළු යෙදවුම්}}$

(ලකුණු 02)

**1.4** රක්ෂණ ඔප්පුවක හිමිකරුවෙකුට අමතර ලාභ ඉපයීමට ඇති හැකියාව වළක්වන මූලධර්මය වන්නේ:

(1) දායකත්වය. (2) ආදේශනය.

(3) හානිපූර්ණය. (4) උපරිම විශ්වාසය. (ලකුණු 02)

**1.5** පහත දැක්වෙන ඒවායෙන් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික (policy interest rates) ලෙස ඇතුළත් **නොවන්නේ** කුමක් ද?

(1) බැංකු පොලී අනුපාතිකය.

(2) ප්‍රති විකුණුම් අනුපාතිකය (නිත්‍ය ණය පහසුකම් අනුපාතය).

(3) ප්‍රති මිලදී ගැනුම් අනුපාතිකය (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය).

(4) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය. (ලකුණු 02)

**1.6** පහත දැක්වෙන ඒවා අතුරෙන් විදේශ වෙළෙඳාමට අයත් සංරචක ලෙස සැලකෙන කාණ්ඩය (group) කුමක් ද?

(1) ආනයන සහ තොග වෙළෙඳාම. (2) තොග වෙළෙඳාම සහ අපනයන.

(3) අපනයන සහ ආනයන. (4) සිල්ලර සහ තොග වෙළෙඳාම.

(ලකුණු 02)

**1.7** "PEST" විශ්ලේෂණය මගින් පරීක්ෂා කරනු ලබන්නේ:

(1) ව්‍යාපාරයකට බලපෑම් කළ හැකි අභ්‍යන්තර පරිසරය සහ අභ්‍යන්තර පරිසර සාධක වේ.

(2) ව්‍යාපාරයකට බලපෑම් කළ හැකි බාහිර පරිසරය සහ ගෝලීය සාධක වේ.

(3) ව්‍යාපාරයකට බලපෑම් කළ හැකි සූක්ෂම පරිසරය සහ සාර්ව පරිසර සාධක වේ.

(4) ව්‍යාපාරයකට බලපෑම් කළ හැකි සූක්ෂම පරිසරය සහ අභ්‍යන්තර පරිසර සාධක වේ.

(ලකුණු 02)

**1.8** පහත දැක්වෙන ඒවායෙන් කාර්ය පරිසරයට (Task Environment) අයත් සංරචකයක් **නොවන්නේ** කුමක්ද ?

(1) පාරිභෝගිකයෝ. (2) තරඟකරුවෝ.

(3) අභ්‍යන්තර කළමනාකරණය. (4) සැපයුම්කරුවෝ. (ලකුණු 02)

**1.9** පෝටර්ගේ වටිනාකම් දාමයට (Porter's Value Chain) අනුව යෙදවුම් ද්‍රව්‍ය ලැබීම, ගබඩා කිරීම සහ තොග පාලනය හඳුනාගෙන ඇත්තේ:

(1) බාහිර ගබඩාකරණය (outbound logistics) ලෙස ය.

(2) උපකාරක ක්‍රියාකාරකම් (supportive activities) ලෙස ය.

(3) අලෙවිකරණ සහ විකුණුම් කටයුතු ලෙස ය.

(4) අභ්‍යන්තර ගබඩාකරණය (inbound logistics) ලෙස ය. (ලකුණු 02)

**1.10** 5S ආකෘතිය (5S model) යටතේ ස්ථම්භයක් (pillar) ලෙස **නොසැලකෙන්නේ** පහත සඳහන් ඒවායින් කුමක් ද?

(1) යෝග්‍යතාවය (suitability).

(2) සුපිරිසිදුකම (shine).

(3) ශික්ෂණය (sustain).

(4) සම්මිතිය (standardize). (ලකුණු 02)

**1.11** පහත දැක්වෙන ඒවායෙන් සේවකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් සත්‍ය වන්නේ කුමක් ද?

(1) තෝරා ගැනීම මගින් ආයතනය වෙත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ සංචිතයක් ජනනය කරයි.

(2) තෝරා ගැනීම යනු ආයතනයක මානව සම්පත අභිප්‍රේරණය කිරීමේ වගකීම ඇති කාර්යයයි.

(3) තෝරා ගැනීම යනු පුරප්පාඩුව පිරවීම සඳහා වඩාත් ම සුදුසු අයදුම්කරු සොයා ගැනීමේ ක්‍රමානුකූල ක්‍රියාවලියකි.

(4) තෝරා ගැනීම මගින් ආයතනයක උපායශීලී ඉලක්ක අත්කර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් තීරණය කරනු ලබයි. (ලකුණු 02)

**1.12** පහත දැක්වෙන ඒවායින්, දත්ත තොරතුරු බවට පරිවර්තනය කරනු **නොලබන** ක්‍රියාව කුමක් ද?

(1) විචලතාවයන් විශ්ලේෂණය කිරීම.

(2) විවිධ සමීකරණ ගණනය කිරීම.

(3) වාර්තා ගොනුගත කිරීම.

(4) සංඛ්‍යාංකවල වෙනස්කම් සංසන්දනය කිරීම.

(ලකුණු 02)

**1.13** මෙන්ඩෙලෝගේ න්‍යාසයට (Mendelow's Matrix) අනුව ඉහළ මට්ටමේ ඇල්මක් සහ බලයක් ඇති පාර්ශවයන් ගලපනු ලබන්නේ:

(1) අඩු උත්සාහයක් දරන්නන් (minimum effort) යටතේ ය.

(2) දැනුවත්කර තබන්නන් (keep informed) යටතේ ය.

(3) ප්‍රධාන ක්‍රියාකරුවන් (key players) යටතේ ය.

(4) තෘප්තිමත්ව තබන්නන් (keep satisfied) යටතේ ය. (ලකුණු 02)

**1.14** අනුස්ථාපනය (induction) ආයතනයකට වැදගත් වන්නේ:

(1) කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සඳහා සුදුසු පුහුණුවක් ලබා දීමට ය.

(2) කාර්ය මණ්ඩලයේ සියලුම නව සාමාජිකයන් සඳහා සුදුසු පුහුණුවක් ලබා දීමට ය.

(3) ආයතනය සමාජයට සපයනු ලබන නව සේවා හඳුන්වා දීමට ය.

(4) ආයතනය ගනුදෙනුකරුවන්ට සපයනු ලබන නව සේවා හඳුන්වා දීමට ය. (ලකුණු 02)

*අංක 1.15 සිට 1.20 දක්වා පහත දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය ද, අසත්‍ය ද** යන්න දක්වන්න. ඔබේ උත්තරය (සත්‍යය හෝ අසත්‍ය යන්න), අදාල ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.15** සාර්ව පරිසරයෙහි සංරචක, ව්‍යාපාරයට සෘජුව පාලනය කළ නොහැක. (ලකුණු 02)

**1.16** හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු.1,000/- ට වඩා වැඩි වන විට එය ලිඛිත ගිවිසුමක් මත පවත්වාගෙන යා යුතුය. (ලකුණු 02)

**1.17** ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු වන්නේ විනිමය අනුපාතය පාලනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ඇති කිරීම ය. (ලකුණු 02)

**1.18** එකම දේපළක් රක්ෂිතයා විසින් රක්ෂණ සමාගම් දෙකක හෝ වැඩි ගණනක රක්ෂණය කර ඇති විට, එය "ප්‍රති රක්ෂණය" ලෙස හැඳින්වේ. (ලකුණු 02)

**1.19** අතිරික්ත ශ්‍රම සැපයුමක් පවතින විට භාවිත කරන ඇතැම් උපාය මාර්ගයන් වන්නේ රැකියාවෙන් නෙරපීම (layoffs), තාවකාලිකව රැකියාවෙන් නතර කිරීම (terminations), තනතුර පහත හෙළීම (demotions) හා විශ්‍රාම ගැන්වීම (retirements) ය. (ලකුණු 02)

**1.20** විනය කළමනාකරණය තුළ ධනාත්මක අභිප්‍රේරණ ක්‍රම සහ සෘණාත්මක අභිප්‍රේරණ ක්‍රම යන දෙවර්ගයම ඇතුලත් ය. (ලකුණු 02)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

"ගෝලියකරණය ව්‍යාපාරික ආයතන සඳහා අනිවාර්ය වී තිබේ. එමඟින් ව්‍යාපාරයන්ට වාසි ද අවාසි ද ගෙනදේ. තවද, ගෝලියකරණය මගින් ව්‍යාපාර ආයතනවලට අවස්ථා සඳහා මාර්ග (opportunities) විවෘත කර දෙනු ලබන අතර තර්ජන (threats) ද ඇති කරයි."

(a) ගෝලියකරණය සඳහා උපකාරක සේවා ඉවහල් වන ආකාරය **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ගෝලියකරණයේ අවස්ථා (opportunities) දෙකක්(02) සහ තර්ජන (threats) දෙකක්(02) **හඳුනා දක්වන්න**.
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

සාමාන්‍යයෙන් ඉල්ලුම නිශ්චිතවම නොදනී. එහෙයින් භාණ්ඩයක නිශ්චිත ඉල්ලුම් ප්‍රමාණයම නිෂ්පාදනය කිරීම කළ නොහැකිය. කෙසේ වෙතත් තොග කළමනාකරණයේ අරමුණු වන්නේ ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් භාණ්ඩ තොග පවත්වාගෙන යන අතරතුර පිරිවැය ද සළුලදායී මට්ටමක පවත්වාගෙන යාමත් ය. එහෙත් සැම විටම තොග, පිරිවැය පාලනය කරන ක්ෂේත්‍රයක් ලෙස නොසැලකේ.

(a) තොග කළමනාකරණය හා සම්බන්ධ මූලික පිරිවැයන් **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) වර්තමානයේ ලෝකය පුරා නිෂ්පාදන ආයතන විසින් භාවිත කරන තොග පාලන පද්ධති (ක්‍රම) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

ප්‍රවර්ධනය යනු නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් දැනුවත් බව ඉහළ නංවන ක්‍රියාකාරකමක් හෝ නිෂ්පාදිතයක් මිලට ගැනීම සඳහා පාරිභෝගිකයන් දිරිමත් කරවන ක්‍රියාකාරකමකි. ප්‍රචාරණය යනු ප්‍රවර්ධනයේ එක් ස්වරූපයක් වුවත් සියලුම ප්‍රවර්ධන කටයුතු ප්‍රචාරණයන් නොවේ.

(a) අලෙවිකරණ මිශ්‍රය සහ ප්‍රවර්ධන මිශ්‍රය අතර පවත්නා වෙනස්කම් දෙකක් (02) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(b) (i) ප්‍රවර්ධන මිශ්‍රයට අයත් උපකරණ දෙකක් (02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(ii) ඉහත (i) යටතේ හඳුනාගත් එක් එක් උපකරණයේ වාසියක් හා අවාසියක් බැගින් **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

අභ්‍යන්තර ජාල (intranet), බාහිර ජාල (extranet) සහ අන්තර්ජාල (internet) තාක්ෂණ භාවිතයන් නූතන සංවිධාන විසින් බහුලව භාවිත කරනු ලැබේ.

(a) ව්‍යාපාර සංවිධානයකට අභ්‍යන්තර ජාල, බාහිර ජාල සහ අන්තර්ජාල තාක්ෂණ භාවිතයන්ගේ වැදගත්කම **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) ව්‍යාපාර සංවිධානයක් සඳහා අන්තර්ජාලයේ භාවිතයන් (uses) හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

DEES යනු Z රටේ දෙවන විශාලතම සුපිරි වෙළෙඳසැල වේ. එය ආහාර, සෙල්ලම් බඩු සහ ගෘහ භාණ්ඩ අලෙවිකරණයේ නියුතු සිල්ලර වෙළෙඳසැලකි. DEES ආයතනය Z රටේ නාගරික, උප නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල සේවකයින් 5,000 කට වඩා සේවයේ නියුක්ත කොට ඇති ප්‍රමුඛතම සේවා යෝජකයෙකි. මෙම සේවකයින් සුපිරි වෙළෙඳ සැල්වල හා ගබඩාවල විවිධත්වයෙන් යුත් රැකියාවල නිරත වේ. Z රට අලංකාර රටක් වන අතර එරටේ ජනතාවගෙන් වැඩි කොටසක් උගත්, ඔවුන්ගේ සංස්කෘතියට නැඹුරු, අපේක්ෂා සහිත පුද්ගලයින් වන අතර පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවය කරනු ලබයි. තව ද නිවර්තන කලාපයට අයත් සෞම්‍ය දේශගුණයක් එම රටේ පවතී.

විශ්වාසවන්ත සේවා යෝජකයෙක් වීම තුලින් ප්‍රමුඛතම සිල්ලර ව්‍යාපාරයක් ලෙස සාර්ථකත්වය ළඟා කර ගැනීමට DEES ව්‍යාපාරයට වුවමනා කරයි. පාරිභෝගිකයන් වෙත සපයනු ලබන අති විශිෂ්ඨ සේවාව ආයතනයේ සිටින කුසලතාවන්ගෙන් යුත් පුහුණු සේවකයන් මත රඳා පවතින බව DEES ආයතනය විශ්වාස කරයි. ළමුන්, සියලුම වයස් කාණ්ඩවලට අයත් ස්ත්‍රීන් හා පිරිමින් සඳහා නව ඇඟළුම් නිෂ්පාදිත රැසක් හඳුන්වා දීම පිණිස සමාගම, **යෝක්** නගරයේ වෙළෙඳ ප්‍රදර්ශනයක් මෑතක දී පවත්වන ලදී. එකී ප්‍රදර්ශනයේදී එහි ප්‍රධාන විධායක නිලධාරියා ප්‍රකාශ කලේ "එහි පාරිභෝගිකයින්ට, සේවකයින්ට සහ සමාජයට නිවැරදි දේ කිරීමට DEES කැපවී ඇති බවයි".

සමාගම, නව ඇගළුම් නිෂ්පාදිත අන්තර්ජාලය හරහා විකිණීම (selling via online) පහසු කර ගැනීම සඳහා නව කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට තීරණය කරන ලදී. තවද, DEES සමාගම Face book වැනි සමාජීය මාධ්‍ය ජාල මෙන්ම සේවකයන් බඳවා දීමට කටයුතු කරන ආයතන ද ඒ සඳහා භාවිත කරයි. නව ව්‍යාපාර අංශය පිහිටුවා මාස තුනක් ගත වීමෙන් පසු DEES ආයතනයට මානව සම්පත් සහ අලෙවි ගැටලුවලට මුහුණ පෑමට සිදුවිය. ප්‍රධාන වශයෙන්, මෙහෙයුම් මට්ටමේ කාර්ය මණ්ඩලය හා සම්බන්ධ ගැටලු කීපයකට ආයතනයට මුහුණ දීමට සිදු වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් DEES සමාගමට සැලකිය යුතු සේවක පිරිවැටුම් අනුපාතිකයක් ද අත්විඳීමට සිදුවී ඇත.

මෙම ගැටලු විසඳා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බාහිර උපදේශකයෙකු සේවයේ යොදවා තිබේ. මෑතක දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී DEES සමාගමේ කළමනාකරණය මේ ගැටලුව පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් උපදේශකවරයාගේ අනාවරණයන් පිළිබඳව සාකච්ඡාවට ගෙන තිබුණි. අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ගැළපෙන කුසලතාවයන්ගෙන් යුත් සේවකයන් DEES ආයතනය විසින් බඳවා ගෙන නොමැති වීම මත මෙම සේවක පිරිවැටුම ඇති වී ඇති බව එහි දී අනාවරණය විය. එහෙයින් යෝග්‍ය බඳවා ගැනීමේ ක්‍රියාවලියක අවශ්‍යතාව කළමනාකරණයේ ප්‍රධාන අවධානයක් බවට පත් වී තිබේ. තව ද ඉලක්ක වෙළෙඳ පොළවල් / කණ්ඩන (segments) හා ඔවුන්ගේ අවශ්‍යතාවන් හොඳින් හඳුනාගෙන නොමැති වීම විකුණුම් පහත වැටීමට බලපෑ ප්‍රධාන හේතුව ලෙස හඳුනාගෙන තිබේ.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) DEES සමාගමට අදාල කරගත හැකි නිවැරැදි බඳවා ගැනීමේ ක්‍රියාවලියේ පියවරයන් **පැහැදිලි කරන්න.**

(ලකුණු 10)

(b) නූතන ඇගලුම් නිෂ්පාදිත සඵලදායී ලෙස විකිණිය හැකි පරිදි වෙළෙඳපොළ කණ්ඩනය කිරීම සඳහා DEES ආයතනයට යොදා ගත හැකි කණ්ඩන උපායමාර්ග (segmenting strategies) **සාකච්ජා කරන්න.** (ලකුණු 10)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |